
# යාළුකමට පුංචි තෑග්ගක්



රොනාරා දහම්දි
7 - B

# යාළුකමට පුංචි තෑග්ගක්

රොනාරා දහම්දි
කතා

මහ/ මහාමායා බාලිකා විදුහල
1 ශ්‍රේණිය C
2026.02.28

ISBN -



# පිදුම

7 ශ්‍රේණිය B පන්තියේ ඉගෙනුම ලබන රොනාරා දහම්දි වන මා හට මෙම පොත් පිංච රචනා කිරීමට සහය දුන් මගේ පන්ති භාර ගුරුතුම් වන මල්කාන්ති ගුරුමෑණියන්ටත්, මගේ ආදරණීය දෙමව්පියන්ටත් ආදරයෙන් පුද කර සිටිමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

එකමත් එක් කාලෙක පුංචි ගමක ලස්සන පවුල් දෙකක් ජීවත් වුණා. මේ පවුල් දෙකේ සම වයසේ පසුවන ළමයි දෙන්නෙක් ජීවත් වුණා. එක්කෙනෙක් තමයි ශේන්‍යා කියන්නේ. එයාට හිටියේ අම්මයි, තාත්තයි, අක්කයි, එයාගෙ ආච්චි. ශේන්‍යා හිටියේ 5 වසරේ. මේ තමයි එක පවුලක් මම කිව්වනේ ශේන්‍යාගේ වයසේ තව කෙනෙක් ඉන්නවා කියලා. ඒ තමයි රනුකි. එයත් හිටියේ 5 වසරේ. එයාට අම්මායි, තාත්තයි, මල්ලී,නංගී විතරක් නෙවෙයි ආච්චි කෙනෙකුයි, සීයා කෙනෙකුයි හිටියා. මේ තමයි අනිත් පවුල. ශේන්‍යාගේ පවුල ටිකක් දුප්පත්. ඒත් ශේන්‍යාටයි එයාගෙ අක්කටයි උගන්නන්න, කන්න, බොන්න, අඳින්න දෙන්නේ මේ අයගේ අම්මයි තාත්තයි සමත් වුණා. රනුකි නම් පොහොසත්. රනුකි ටිකක් සංකර නිසා එයාට හිටියේ එකම එක යාළුවයි. ඒ තමයි ශේන්‍යා. මේ දෙන්නා ගියෙත් එකම ඉස්කෝලෙට.

ඉතිං රනුකිගේ උපන්දිනේ ළඟ ළඟ ම එනවා. ශේන්‍යාගේ හිතේ පුංචි දුකක් තිබුණා. ඒ එයාට රනුකිගේ උපන්දිනේට තෑග්ගක් අරන් දීමට නොහැකි වීම ගැන. ඒත් ශේන්‍යා දැනගෙන හිටියා, එයාගෙ අම්මටයි තාත්තටයි කිව්වොත් ඉල්ලන ඕන දෙයක් මහන්සිවෙලා හම්බ කරලා ගෙනත් දෙනවා කියලා. ඒත් එයාට ඕන වුණේ නැහැ අම්මගෙයි තාත්තගෙයි සල්ලි වලින් තෑග්ගක් ගන්න. එයාට ඕන වුණේ එයා එකතු කරපු සල්ලි වලින් රනුකිට තැග්ගක් ගන්න. දවසක් ශේන්‍යා එයාගේ අක්කත් එක්ක ඉස්කෝලෙ ඇරිලා ගෙදර යනකොට ශේන්‍යා දැක්කා ලස්සන ම ලස්සන රෝසපාට බෝනික්කෙක්. එයා එයාගෙ අක්කටත් ඒක කිව්වා. ශේන්‍යාට ඕනේ වුණා ඒ බෝනික්කව රනුකිට තෑගි දෙන්න. ඒත් ඒ බෝනික්කා ගොඩක් ගණන් නිසා ශේන්‍යා හිතුවා ඒ බෝනික්කව රනුකිට දෙන්න බැරිවෙයි කියලා. ශේන්‍යා කඩේ ලග හිටගෙන බෝනික්කෙක් දිහා බලන් ඉන්නවා දැක්කා. රනුකිටනම් හොඳටම කේන්ති ගියා. ඒ වගේම ලොකු දුකකුත් ඇති වුණා. මොකද එයා දැනගත්තා ශේන්‍යා ඒක දිහා බලාගෙන හිටියේ එයාට තෑග්ගක් විදිහට දෙන්න ඕන නිසා කියලා. ඒ වගේ ම ඇයට ඒක ගන්න සල්ලි නෑ කියලත් දැනගෙන හිටියා. රනුකිට තරහ ගියේ එයා ශේනාෘාගෙන් කිසි ම තෑග්ගක් බලාපොරොත්තු නොවුණ නිසා. ශේන්‍යා ගෙදර ගිහින් ඒ බෝනික්කා ගන්න සල්ලි තියෙනවා ද කියලා බැලුවා. ඒත් ඒක ගන්න තරම් මුදලක් ශේන්‍යාගේ

කැටේ තිබුණේ නැහැ. ඊළඟ දවසේ ශේන්‍යා ඉස්කෝලෙ ගියෙ හරිම අවුලෙන්. ඒ වගේම රනුකිත් ස්කෝලෙ ගියේ හරිම දුකෙන්. ඒ වගේම තරහින් ශේන්‍යාව මඟ හැරියා. දකින දකින හැම වෙලාවෙම, හැම තැනකදීම මඟහැරියා. කොටින්ම කිව්වොත් පන්තියේදිවත් ඇය දිහා හැරිලා බැලුවෙ නැහැ. ශේන්‍යාට ගොඩක් දුක හිතිණා. ඇය දැනගෙන හිටියේ නැහැ රනුකි මැයව මඟහරින්නේ ඇයි කියලා. ටික දවසක් ගත වුණා දෙදෙනා නොදැනුවත්වම දෙපැත්තකට වුණා. ශේනායා දැන් ප්‍රශ්න දෙකක හිර වෙලා. එකක් තමයි රනුකිගෙ තෑග්ග ගන්න එක. අනිත් එක තමයි ඇයි රනුකි තරහ වෙලා ඉන්නෙ කියන එක. දවසක් ශේන්‍යා රනුකිගෙන් මෙසේ ප්‍රශ්න කළා.

"රනුකි, ඇයි එයා මාව මග හරින්නේ. ඇයි මාත් එක්ක තරහා. මං මොකද්ද කරපු වැරැද්ද."

මෙසේ ප්‍රශ්න කල විට රනුකිගේ සිත පෑරී ගියා. රනුකි එදා සිද්ධ වුණ සිද්ධිය පවසමින් ශේනයාට බැන වැදුණා. මේ දෙදෙනාගේ ම සිත් බිඳී ගියා. එහෙත් හඳ පතුලේ රැඳී ඇත්තේ යාළුකමයි.

"දුවේ, ඇයි මේ අඩන්නේ?" යැයි ප්‍රහ්න කළා. "අත්තම්මේ, රනුකි මාත් එක්ක තරහ වුණා." යැයි හඬමින් පිළිගුරු දුන්නා.

ඊළගට රනුකි. එයත් ශේන්‍යා වගේමයි, එයත් හොඳටම අඩනවා. එයාට දැන් තේරිලා ශේන්‍යා එහෙම කළේ එයා වෙනුවෙන් තියන යාළුකමටයි කියලා. ඇයට සමාව ගන්න ඕන වුණත් දැන් එළඹී ඇත්තේ දෙසැම්බර් නිවාඩු කාලයයි. නිවාඩුවෙන් පසු සමාව ගන්න හැකි වණාත් ඇයට ඕන වුණේ උපන් දිනයට පෙර සමාව ගැනීමට. ඇයගේ උපන් දිනය යෙදී තිබුණේ දෙසැම්බර් 24 වන දාටයි. රනුකි අඩමින් ඉන්නවා දැක්ක රනුකිගේ මව වුණ රන්දුනුගේ මහත්මිය රනුකි අඩන හේතුව දැන, පසු දා රනුකි පංති ගිය අවස්ථාවේ ශේන්‍යාගේ නිවසට ගියා ය. ඒ අවස්ථාවේ දී ශේන්‍යා ද දහම් පාසල් ගොස් තිබුණි. ඉතින් රන්දුනුගේ මහත්මිය මේ පිළිබඳ ශ්‍රේන්‍යාගේ දෙමව්පියන් සමඟ කතා බහ කළා ය. ශේන්‍යාගේ දෙමව්පියන්

මේ පිළිබඳව දැනගත්තෙත් මේ අවස්තාවේ දී ය. රනුකිගේ දෙමව්පියන් රනුකිටත් නොකියාම උපන්දින සාදයක් සූදානම් කර තිබුණා. ශේන්‍යාගේ මිත්තණිය, රන්දුනගේ මහත්මියට රසම රස තේකකින් සහ බිස්කට් වලින් සංග්‍රහ කළා. තේක රස විඳීමෙන් පසු රන්දුනගේ මහත්මිය පිටත්වීමට සූදානම් වුණා. යන අවස්ථාවේ ඇය මෙසේ පැවසුවා.

" තේකනම් හරිම රසයි. මගේ දුවගේ උපන් දින සාදයට අනිවාර්යෙන්ම එන්න ඕනේ. ඔයගොල්ලන් නැත්තම් මේ සාදයෙන් වැඩක් නැහැ. මෙසේ සාදයට ආරාධනා කරමින් පිටත්ව ගියා."

ඇය ගියාට පසු ශේන්‍යාගේ දෙමව්පියන් මේ පිළිබඳ හේන්‍යාගේ වැඩිමහල් සහෝදරිය වන සඳුනිගෙන් විමසුවා. එවිට ඇය එදින වුණ සියලු දේ පැවසුවා. ශේන්‍යා රෝස පාට බොනික්කෙකු දෙස බලා සිටි බවත්, එය මිල දී ගැනීම සඳහා ඇයගේ කැටය කැඩුව බවත් සඳුනි පැවසුවා.

උදෑසන 11.00 පමණ වන විට ශේන්‍යා නිවසට පැමිණියා එවිට නිවසේ සිටියේ ඇයගේ සහෝදරිය සහ අත්තම්මා පමණයි. ඇය නිවසට ගොඩ වූ ගමන් ප්‍රශ්න කළේ ඇගේ දෙමව්පියන් කොහේ ද යන වගයි. එයට අත්තම්මාගේ පිළිතුර වූයේ පුංචි සිනහවක් පමණයි. ඇය දෙමව්පියන් පැමිණෙන තුරු ගෙයි පිළ උඩ හිඳගෙන බලාගෙන සිටියා ය. එකවරම මහා වර්ෂාවක් ඇද හැලීමට පටන් ගත්තේ ය. ඇගේ සිතේ දෙමව්පියන්ට කරදරයක් සිදු වි ඇත් ද යන්න කුඩා බියක් තිබුණි. රාත්‍රිය උදාවෙමින් තිබුණ අතර වැටෙන අඳුරේ දී කඩුල්ල උඩින් පැන ගෙදරට පායනගෙන මවගේ සහ පියාගේ සෙවණැල්ල දුටු ශේන්‍යාගේ සිතට දැනුනේ පුදුමාකාර සතුටකි. එහෙත් ඔවුන්ගේ දැත් තිබුණු බෑග් තොගය දුටු ශේන්‍යාට නම් අදහා ගත නොහැකි විය. ඇයගේ සිතට පුංචි සතුටක් දැනුණි. දෙමව්පියන් ගෙට ගොඩ වූ අවස්ථාවේ පළමුවෙන් ඔවුන්ගේ පිළිතුර වූයේ,

"මේ ද, මේ තියෙන්නේ.... අපිට සාදයකට යන්න ඇඳුම් වගයක්." මව පැවුසුවා.

"සාදයක්, ඒත් .... කාගෙද?. එතකොට ඔයා අනිත් මල්ලේ තියෙන්නේ මොනවාද?." ශේන්‍යා තව දුරටත් ප්‍රශ්න කළා.

"කවු ද? . කාගෙද? කියන එක වැඩක් නෑනෙ. යන එකනේ වැදගත්, මේ මල්ලෙ තියෙන්නනේ එයාට දෙන්න තියෙන තෑග්ග." පියාගෙ පිළිතුර වූයේ එයයි.

දෙසැම්බර් 24 වෙනි දා, එනම් රනුකිගේ උපන් දිනය දා උදා විය. ඇයට වත් මතක තිබුණේ නැහැ, අද ඇයගේ උපන්දිනය කියලයා. ඇගේ සිතේ තවමත් තිබුණේ ශේන්‍යාත් එක්ක වුණ රණ්ඩුව ගැන. රනුකි සවස් වන තුරුම අඩමින් සිටියා. එහෙත් ඇයගේ දෙමව්පියෝ, මල්ලී, නංගී වගේම අච්චි සහ සීයාත් ඇගේ උපන් දින සාදය සඳහා සැරසිලි කරමින් සිටියා.

එත් එක්කම ශේන්‍යාත් පාඩමින් හිටියා. එයාට රනුකිගේ උපන් දිනය අමතක වුණේ නැහැ. ඒත් ඇයට සුභ පැතීමට බැරි විම ගැන ඇයට දුකක් තිබුණා. ඒත් එක්ක ම ශේනාාගේ අම්මා ශේන්‍යා ළඟට ඇවිත් මෙහෙම කිව්වා.

"දැනවත් මට කියනවා ද ඔය සාදෙ කාගෙද කියලා." යැයි ශේන්‍යා ප්‍රශ්න කළා. ඒ අවස්ථාවේ දී,

"මේ සාදය මගේ යාළුවෙක්ගෙ දුවෙක්ගෙ. එයත් ඔයාගෙ වයස වගේ වෙන්න ඇති" යැයි මව පැවසුවා ය. අය එසේ පැවසුවේ ඇගේ දියණිය වන වන ශේන්‍යාගේ සිත සැනසවීමට හා පුදුම කිරීමේ අරමුණෙන්. ශේන්‍යා කඳුළු පිස, නැගිට අම්මා දුන් ගව්ම ඇඳ ගත්තා.

රනුකිගේ කාමරයට ගොඩ වූ රන්දුනගේ මහත්මිය, රනුකිට ලස්සන ගවුමක් දී මෙසේ පැවසුවා.

"මේ ගවුම ඇඳගෙන ඉක්මනට පහළට එන්න. අද ඔයා ලස්සනට ඉන්න ඕන දවසක්" එසේ පැවසූ විට රනුකිගේ මුහුනේ සිනහවක් පහළ වුවත්,

පුදුම සහගත බවක් නම් නොපෙනුණි.

රනුකිගේ මවගේ පැත්තේ ඥාතීන් හා පියාගේ පැත්තේ ඥාතීන්, අම්මාගේ හා පියාගේ ඉස්කෝලෙ යාළුවෝ, ඔවුන් වැඩ කරන තැන් වල යාළුවෝ, නංගිගේ, මල්ලිගේ යාළුවෝ වගේ ම අසල්වාසීනුත් පැමිණ සිටියා. රනුකි බෝනික්කෙක් වගේ ඇඳගෙන පඩිපෙළෙන් බසින විට සැවොම පුදුම වී බලාසිටියේ ඇගේ සුන්දරත්වය දෙසය. ඇයගේ හිසේ සිට පාදය දක්වාම ඇය අලංකාර ලෙස හැඩ ගැසී සිටියා. එහි දී ඇයගේ මුහුණේ සිනහවක් පැවතුනත්, එය අවංක සිනහවක් නොවේ. ඇයගේ මුහුණේ පැවතුණු දුක් බර පෙනුම නිසා පැමිණ සිටි සියලු දෙනාට එය වැටහුණි. සැමිණ සිටින පිරිස අතරින් ඇය සෙව්වේ එක් අයෙකි. ඒ තමයි ශේන්‍යා. ඒත් ශේන්‍යා නොදුටු රනුකිගේ සිතට ඇති වුණේ දුකක් පමණකි.

ශේන්‍යා සහ ඇයගේ පවුලේ අය යන සාදයට තව ටික දුරක් පමණයි. ශේන්‍යා දැකලා නැති ප්‍රදේශයක් වුණත් කුමක් හෝ හුරු බවක් දැනුණි. සාදය තිබෙන නිවසට පැමිණියත් ශේන්‍යා ඒ නිවසවත් දැක තිබුණේ නැත. මව නිවසේ සීනුව නාද කළා.



ඒ එක්කම රනුකිටත් සීනු නාදය ඇසුනා. රන්දුනගේ මහත්මිය දොර ඇරියා. ඒ එක්කම රනුකිටත් හරිම සතුටුයි. ඒ වගේ ම හරිම පුදුමයි. ශේන්‍යාටත් අදහාගත නොහැකි පුදුමයක් හා සතුටක් දැනුණි. රනුකි වේගයෙන් දුවගෙන දුවගෙන ඇවිත් ශේනයාව වැළඳ ගත්තා. තව පොඩ්ඩෙන් දෙන්නම පිටිපස්සට වැටෙනවා. ඒත් ඒ එක්කම රනුකි, ශේන්‍යාගෙන් සමාව ගන්නත් අමතක කළේ නෑ.

"මට සමාවෙන්න. මට ටික දවසක් ගියහමයි තේරුණේ ඔයා එහෙම කළේ යාළුකමටයි කියලා. මට සමාවෙන්න" යැයි කියමින් රනුකි ශේන්‍යාගෙන් සමාව ගත්තා.

"මටත් සමාවෙන්න. මගෙත් වැරැද්දක් තියනවානේ. මට තිබුණා ඔයාට දුක හිතෙන විදිහෙ වැඩක් නොකර ඉන්න." යැයි කියා ආයෙත් සමාව ගනිමින් හැඬීමට පටන් ගත්තාය.

ශේන්‍යාගේ මව දෙදෙනාගේම උරහිස් වලට අත්තබා මෙසේ පැවසුවා.

"අද අඬන්න ඕනෙ දවසක් නෙවෙයිණේ." යැයි කියමින් මව කීවා. ඒත් සමඟම සඳුනි රනුකිට ගෙන ආ තෑග්ග ඇයට භාර දුන්නා. ඒත් ඒක භාර ගන්න රනුකිට හිතක් තිබුණේ නැහැ. ඒ අවස්ථාවේ රන්දුනගේ මහත්මිය මෙසේ පැවසුවා.

"ඒක භාර ගන්න. නැත්තම් යාළුවා තරහ වෙයි. කවුරු හරි දෙන තෑග්ගක් ප්‍රතික්ෂේප කරන එක අපේ සිරිතක් නෙවෙයි." යැයි කීවා ය. රනුකි ස්තූති කර එය භාරගත්තා.

"ඇයි ඕක ඇරලා බලන්නැත්තේ? ඉක්මනට ඇරලා බලන්න." ශේන්‍යාගේ අත්තම්මා පැවසුවා ය.

ඒ අවස්ථාවේ ශේනාෘා සහ රනුකි අදහා ගත නොහැකි දසුනක් දැක්කා. ඒ රෝසමල් කොළයෙන් ඔතලා තිබුණේ ශේනාෘා දෙන්න බලන් හිටපු රෝස පාට බෝනික්කායි.



ශේන්‍යා ට වගේ ම අනුකිටත් හරි ම සතුටුයි. රනුකි වගේම ශේනායාත් වැඩියෙන් ම සතුටු වුණේ එදිනය. උපන් දින කේක් එක කැපුවාට පසුසේ සාදයට පැමිණි සැවොම විනෝද වුණා. දෙදෙනාගේ ම දෙමව්පියන් තේකක් රස විඳිමින් සුහඳ කතා බහක යෙදී සිටියා. ශේන්‍යා, රනුකි, සඳුනි සහ රනුකිගේ සහෝරයා සහ රනුකිගේ සහෝදරිය නිවසේ අස්සක් මුල්ලක් නෑර ඇවිදිමින් රස රස කෑමත් රස විඳිමින් සිනහ නගමින් ඇවිද්දා. ඒ අතරේ ම හෙට දිනයට යෙදී තිබුණු නත්තල වෙනුවෙන් හැමෝම වගේ සකස් කරන නත්තල් ගස සැරසීමට පටන් ගත්තා. අවසානයේ ඔවුන්ට අදහාගත නොහැකි, ඉතාමත් දැකුම්කළු නත්තල් ගහස් ලැබුණි. එම නත්තල් ගස රනුකිගේ නිවසට ගෙන දුන්නේ අමුතුම අලංකාරයකි. එය, එතනින් යන ඕනෑම අයෙකුගේ ඇස් වශී කරගන්නකි. එය රනුකිගේ නිවසේ කැපී පෙනෙන දසුනක් වෙනවා නොඅනුමානයි.

රාත්‍රී 9.00 පමණ වන විට සාදය අවසන් විය. සාදයට පැමිණි සැවොම රනුකිට සුබ පතමින් පිටව ගියා. අවසානයේ ඉතිරි වුණේ ශෙන්‍යා සහ ශේනායාගේ පවුලේ අය පමණයි. හෙට සමරන නත්තග වෙනුවෙන් පල්ලියට යාම සඳහා උදෑසන 8.00 යොදා ගෙන තිබුණා. හෙට හමු වීමේ බලාපොරොත්තුවෙන් රනුකිටත් සුබ පතා නිවසින් පිටව ගියා.

නත්තල් දිනය උදා වුණා. ජේසුස් වහන්සේගේ උපත සමරන මේ දිනයේ පල්ලි යාම සඳහා රනුකිගේ පවුල සහ ශේන්‍යා ගේ පවුලේ විතරක් නෙවෙයි නගරයේ සිටින සියලුම කතෝලිකයින් උදෑසනම අවදි වී සූදානම් වුණා. ඒ අතරින් කැපී පෙනෙන ගැහැණු දරුවන් සැරසී සිටියේ වළළු කර ළඟමට ඇදෙන, දැකුම්කළු දිග ගවුමකිනුත්, අත්වැසුම් වලින් සහ අඩි උස සපත්තු වලිනි. රනුකිගේ පවුල සහ ශේන්‍යාගේ පවුල උදෑසන 8 වන විට පල්ලියට පැමිණ සිටියා. පැමිණ සිටි සෙනඟ නිසා ඔවුන්ට ඇතුල් වීමට ප්‍රමාද වුණා. එහෙත් උදෑසන 8.30 පමණ වන විට ඔවුන්ට ඇතුළට යාමට හැකි වුණා. එහි දී.

"සතුටින්, සාමයෙන් හා එකමුතුවෙන් සිටීමට හැකි වේවා." යැයි ප්‍රාර්ථනා කළා.



වසර 10 කට පසු

ශේන්‍යාට සහ රනුකිට දැන වයස අවුරුදු 20ක් පමණ වන අතර ඔවුන් දැන් විශ්වවිදයාල ගොස් උසස් අධ්‍යාපනය හදාරන අතර ඔවුන් තවමත් හොඳම යාළුවන් වෙති. ඔවුන් දෙදෙනාම වෛද්‍යවරියන් වීමට උත්සහ දරති.

"ශේන්‍යා, ඔයාට මතක ද දන්නේ නෑඳ මීට අවුරුදු 10 කට කලින් මගේ දහවෙනි උපන් දිනය දවසේ ඔයා මාව පුදුම කරපු වෙලාව." රනුකි ඇහුවා.

"මොකද මට මතක නැත්තේ. මට හොඳට මතකයි. එදා ඔයා විතරක් නෙවෙයි, මමත් පුදුම වුණානේ. ඔයාට මතකද අපි දෙන්නා එකම ලකුනු අරන් A/Lපාස් වෙලා විශ්වවිද්‍යාලයට තෝර ගත්තා කිලයලා දැනගත්ත වෙලාව ශේන්‍යා උත්තර දෙමින් ප්‍රශ්න කළා."

"මට මතකයි." යැයි කියමින් දෙදෙනාම අතීතය සිහියට නැගුවා. ඒ සමඟම සතුටු වුණා. අවසානයේ මොවුන් වෛද්‍යවරියන් වීමට සුදුසුකම් ලබමින් සමාජයට පිවිසියා.

මෙම කතාවෙන් කියැවෙන්නේ යහපත් මිතුරන්ගේ ගතිගුණ ගැනයි. මෙයින් මෙම කතාවේ නිමාව සනිටුහන් කරමි.





අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN -**